| 25-11-2025 | උදෑසන මුරලි | ඕම් ශාන්ති | බාප්දාදා | මධුබන් |
|---|---|---|---|---|

**සාරය:** සුමිහිරි දරුවනි, ජීවාත්මය සතෝප්‍රධාන් කරගැනීමට සැලකිළිමත් වන්න. දුර්වලතාවයන් ඉතිරි කර නොගැනීමට සහ මායා ඔබ ලවා වැරදි නොකරන ලෙසට වගබලා ගන්න.

**ප්‍රශ්නය:** ඔය දරුවන්ගේ මුවින් නිරන්තරයෙන් මතු විය යුත්තේ කුමන ශුභ වදන්ද?

**පිළිතුර:** නිරන්තරයෙන් මෙම ශුභ වචන පවසන්න: අපි සාමාන්‍ය මනුෂ්‍යයින්ගෙන් නාරායන බවට පත් වන්නෙමු, ඊට අඩු නොවෙමු. අපි ලෝකයේ අධිපතියන් වශයෙන් සිටි අතර නැවත වරක් එය බවට පත් වන්නෙමු. කෙසේවෙතත්, මෙම අරමුණ ඉතාමත්ම ඉහළයි. එබැවින් ඔබ උපරිම වශයෙන් ප්‍රවේශම් විය යුතුයි. ඔබගේ දින වාර්තාව පරීක්ෂා කර බලන්න. ඔබගේ අරමුණ සහ ඉලක්කය ඔබ ඉදිරියේ තබාගන්න, අඛණ්ඩව උත්සාහ දරන්න, අධෛර්යමත් නොවන්න.

ඕම් ශාන්ති. පරම පියා මෙතැන අසුන්ගෙන ඔය ආධ්‍යාත්මික දරුවන්ට විස්තර කරයි. ඔබ සිහිපත් කිරීමේ වන්දනාවේ මෙතැන අසුන් ගන්නා විට, සහෝදර සහෝදරියන්ට විස්තර කරන්න ජීවාත්ම අවධානයෙන් මෙහි අසුන්ගෙන පරම පියාව සිහි කරන්න. ඔබ මේ ගැන ඔවුන්ට සිහිපත් කළ යුතුයි. ඔබට දැන් මෙම අවධානය ලබා දෙනවා. මා ජීවාත්මයක් වන අතර, මට ඉගැන්වීම සඳහා, මගේ පියා පැමිණ ඇත. මා භෞතික අවයව තුළින් ඉගෙනගන්නවා. පරම පියාද භෞතික අවයවයන්ගේ ආධාරය ගෙන, මෙම කෙනා තුළින් පළමුවෙන්ම මෙසේ පවසයි පරම පියාව සිහි කරන්න! මෙය ඥාන මාර්ගය බව, ඔය දරුවන්ට විස්තර කර දී ඇත මෙයට භක්ති මාර්ගය කියා නොකියයි. ඥානය ලබා දෙන්නේ, ඥාන මහා සයුර වන පාරිශුද්ධකරු පමණයි. ඔබට උගන්වනු ලබන අංක එකේ පාඩම වන්නේ තමන් ජීවාත්මයක් බව සළකා, පියාව සිහි කරන්න. මෙය වඩාත්ම අවශ්‍යයි. වෙනත් කිසිම සත්සංගමයක මෙය පවසන අන්දම ඔවුන් නොදනී. ඔබට සවන් දීමෙන් පසුව, මෙයම ඔවුන්ද පවසන, බොහෝ කෘත්‍රිම ආයතන තිබෙන නමුත්, එහි සැබෑ අරුත ඔවුන්ට නොවැටහෙයි. එය විස්තර කිරීමට අවශ්‍ය ඥානය ඔවුන්ට නොමැත. පරම පියා ඔය දරුවන්ට පවසන්නේ මෙපමණයි අසීමිත පියාව සිහිකරන්න, එවිට ඔබගේ පාපයන් දුරු වනු ඇත. මෙය පැරණි ලෝකය බව, නුවණද කියයි. නව ලෝකය සහ පැරණි ලෝකය අතර, විශාල වෙනසක් තිබේ. එය පිවිතුරු ලෝකය වන අතර, මෙය අපවිත්‍ර ලෝකයයි. ඔබ අඬ ගසන්නේ අහෝ, පාර්ශුද්ධකරුවාණෙනි පැමිණෙන්න! පැමිණ අපව පිවිතුරු කරන්න! ගීතාවේ මෙම වැකිය තිබේ නිරන්තරයෙන් මා පමණක් සිහි කරන්න. සියළුම ශාරීරික සබඳතා අත්හැර, තමන් ජීවාත්මයක් බව සළකන්න. ආරම්භයේදී ඔබට කිසිම ශාරීරික සම්බන්ධතා නොමැත. ඔය ජීවාත්ම, මෙහි පැමිණෙන්නේ ඔබගේ චරිත කොටස් රඟපෑමටයි. මෙසේ සිහි කෙරෙයි ඔබ තනිවම එන අතර, ඔබ තනිවම ආපසු යා යුතුයි. මෙහි අරුත මිනිසුන්ට නොවැටහෙයි. ඔබට මෙය දැන් ප්‍රායෝගික අන්දමකින් වැටහෙයි. අප දැන් සිහිපත් කිරීමේ වන්දනාව තුළින් සහ යෝගා බලයෙන් පාරිශුද්ධත්වයට පත් වනවා. මෙය රාජයෝගාවේ බලයයි. අනෙක, මනුෂ්‍යයින් කෙටි කාලයකට නිරෝගී වන, හත යෝගාවයි. ස්වර්ණමය යුගයෙදී ඔබ බොහෝ නීරෝගීව සිටින නිසා, හත යෝගාවට එහිදී අවශ්‍යතාවයක් නැත. ඔබ එය කරන්නේ මෙහි, මෙම අපිරිසිදු ලෝකයේය. මෙය පැරණි ලෝකයයි. ස්වර්ණමය යුගයේ, දැන් ගෙවී ගොස් ඇති නව ලෝකයේ, ලක්ෂ්මි සහ නාරායන්ගේ රාජධානිය පැවතුණි. කිසි කෙනෙක් මෙය නොදනී. එහි සෑම දෙයක්ම අළුත්ය. මෙවැනි ගීයකි අවදිවන්න මනාලියනි, අවදිවන්න! නව ලෝකය, ස්වර්ණමය යුගයයි පැරණි ලෝකය, කලි යුගයයි. මෙයට සත්සංගමයක් (ආධ්‍යාත්මික හමුවක්) කියා කිසිවෙකු නොකියයි. එය දැන් කලි යුගය බව, පරම පියා ඔබට මතක් කර දී ඇත. ඉගෙන ගැනීමෙන් ඔබට නව ලෝකයේ රාජකීය තත්ත්වයක් ලබා ගත හැකි බව, වෙනත් කිසිම ගුරුවරයෙක් ඔබට නොකියයි. වෙනත් කිසිම කෙනෙකුට මෙසේ කිව නොහැක. ඔය දරුවන්ට සෑම දෙයක්ම මතක් කර දෙනු ලබනවා. නොසැලකිළිමත් වන්නට එපා. බාබා දිගින් දිගටම ඔබ සියළු දෙනාටම විස්තර කරයි ඔබ කොහේ අසුන් ගෙන සිටියත්, කුමන ව්‍යාපාරයක් සිදු කරමින් සිටියත්, තමන් ජීවාත්මයක් බව සළකා, එය සිදු කරන්න. ඔබගේ ව්‍යාපාරයේ කිසියම් අපහසුතාවයක් හෝ මන්දගාමී බවක් ඇති වන ඕනෑම විටෙක, සිහිපත් කිරීමේ අසුන් ගැනීමට හැකිතාක් කාලය සාදාගන්න, මන්ද ජීවාත්මය පිවිතුරු වන්නේ එවිට පමණයි වෙනත් මඟක් නැත. ඔබ නව ලෝකය සඳහා රාජ යෝගාව ඉගෙනගන්නවා. කලි යුග ජීවයන්හට එහි යා නොහැක. මායා, ජීවාත්මයන්ගේ අත්තටු සිඳ දමා ඇත. ජීවාත්ම පියාසර කරනවා නොවේද? ඔවුන්ගේ සිරුරු හළා, ඔවුන්

වෙනත් ඒවා ගනී. වඩාත්ම වේගවත්ම රොකැට්ටුව වන්නේ ජීවාත්මයයි. මෙම අළුත් දේවල් ඇසෙන විට ඔය දරුවන් විශ්මයට පත් වනවා. ඔය ජීවාත්ම, ඉතාමත්ම පුංචි රොකැට්ටුයි ඔබ සෑම කෙනෙක් තුළම උපත් 84ක චරිත කොටසක් පටිගත වී ඇත. මෙවන් දේ ඔබගේ හදවතේ තබාගැනීමෙන් ඔබ උද්යෝගීමත් වෙයි. පාසැලක ශිෂ්‍යයන්ට ඔවුන්ගේ ඉගෙනුම සිහි වෙයි. ඔබගේ බුද්ධිය තුළ දැන් තිබෙන්නේ මොනවාද? බුද්ධිය තිබෙන්නේ සිරුරේ නොවෙයි මනස සහ බුද්ධිය තිබෙන්නේ ජීවාත්මයේය. ඉගෙන ගන්නේ ජීවාත්මයයි. ඊකියාවක් කරන්නේ ජීවාත්මයයි. ශිව බාබාද ජීවාත්මයක් වන නමුත් ඔහුට ‘පරමාත්ම’යැයි කියයි. ඔහු ඥාන මහා සයුරයි. ඔහු ඉතාමත්ම කුඩා තිතකි. පියාගේ සංස්කාර වලින් ඔය දරුවන්ව පුරවන බව, කිසිවෙක් නොදනී. ඔබ දැන් යෝගා බලයෙන් පිවිතුරු වෙනවා. ඒ සඳහා ඔබ උත්සාහ දැරිය යුතුයි. ඔබගේ ඉගෙනුමේ අසමත් නොවීමට ඔබ සැලකිලිමත් විය යුතුයි. මෙහි අංක එකේ විෂය වන්නේ මා වන මෙම ජීවාත්මය, සතෝප්‍රධාන් විය යුතුයි. කිසිම දුර්වලතාවයක් ඉතිරි නොවිය යුතුයි. ඒසේ නැත්නම් ඔබ අසමත් වෙයි. මායා ඔබට සෑම දෙයක්ම අමතක කරවනවා. ඔබ මුළු දවස පුරාම පාපකාරී ක්‍රියාවක් නොකිරීම සඳහා, ඔය ජීවාත්ම වලට වාර්තාවක් තබාගැනීමට අවශ්‍ය වුවත්, මායා ඔබට දිනපතා වාර්තාවක් තැබීමට ඉඩ නොදෙයි. ඔබ මායාගේ උල් නිය වල සිරගත වෙයි. ඔබගේ හදවත පවසන්නේ මා දින වාර්තාවක් තබාගත යුතුයි. ව්‍යාපාරිකයන් සෑම විටෙකම ඔවුන්ගේ ලාභ සහ පාඩු වල ගිණුම් තබාගනී. මෙය ඔබගේ ඉතා විශාල ගිණුමයි. මෙය උපත් 21 කට ආදායමකි, එබැවින් ඔබ කිසිම අතපසු වීමක් සිදු නොකළ යුතුයි. ඔබගෙන් ඇතැම් දරුවන් අතින් බොහෝ සේ වැරදීම් සිදුවෙයි. සමහර දරුවන් මෙම බාබාව සූක්ෂම කලාපයේ මෙන්ම දිව්‍යලෝකයේද දකියි. මෙම බාබාද බොහෝ උත්සාහ දරන අතර, ඔහු දිගින් දිගටම විශ්මයට පත් වෙයි. මා ස්නානය කරන්නේ, ආහාර ගන්නේ, බාබාගේ සිහිපත් කිරීමේ සිටයි, ඒ වුවත් මට ඔහුව අමතක වෙයි! ඉන්පසුව මා නැවතත් ඔහුව සිහි කිරීමට පටන් ගන්නවා. මෙය ඉතා විශාල විෂයක්. මෙහි කිසිම මත ගැටුමක් නොතිබිය යුතුයි. ගීතාවේ කියැවෙන්නේ ශරීරය සහ සියළුම ශාරීරික නෑදැයින් අත්හරින්න. එවිට ඉතිරි වන්නේ ජීවාත්මය පමණයි. ශරීරය අමතක කර, තමන් ජීවාත්මයක් බව සලකන්න! අපවිත්‍ර සහ තමෝප්‍රධාන් වන්නේ ජීවාත්මයයි. කෙසේවෙතත්, මනුෂ්‍යයින් පවසන්නේ, ජීවාත්ම, ක්‍රියාවන් ගේ ඵලයේ බලපෑමට හසු නොවන බවයි. ඔවුන් පවසන්නේ ජීවාත්මය, පරමාත්ම ජීවය බව සහ ඔහුද ජීවාත්මයක් නිසා, ජීවාත්ම, ක්‍රියාවන්ගේ ඵලයේ බලපෑමට හසු නොවන බවයි. තමෝගුණී මනුෂ්‍යයින්, තමෝගුණී ඉගැන්වීම් ලබා දෙයි ඔවුන්ට ඔබව සතෝගුණී කළ නොහැක. ඔබ භක්ති මාර්ගයේ තමෝප්‍රධාන් වෙයි. සෑම දෙයක්ම ආරම්භයේදී සතෝප්‍රධාන් වන අතර, ඉන්පසුව රජෝ සහ තමෝ තත්ත්ව හරහා යයි. නිර්මාණ කිරීම සහ විනාශ කිරීම ඇත. නව ලෝකයේ නිර්මාණය, පරම පියා විසින් දිරි ගැන්වෙන අතර ඉන්පසුව මෙම පැරණි ලෝකයේ විනාශය සිදුවෙයි. නව ලෝකයේ නිර්මාණකරු වන්නේ පරමාත්ම දෙවියන්ය. මෙම පැරණි ලෝකය පරිවර්ථනය වී, අළුත් වෙයි. නව ලෝකයේ සළකුණු වන්නේ මෙම ලක්ෂ්මි සහ නාරායන්ය. ඔවුන් නව ලෝකයේ අධිපතියන්ය. නව ලෝකය කියා, රිදී යුගයට පවා නොකියයි. කලි යුගය, පැරණි ලෝකය වන අතර, ස්වර්ණමය යුගය, නව ලෝකයයි. කලි යුගයේ අවසානය සහ නව ලෝකයේ ආරම්භය අතරමැද මෙම සංගම යුගය තිබේ. කෙනෙක් MA හෝ BA විභාගයකට ඉගෙන ගන්නා විට, ඔහු බොහෝ උසස් වෙයි. ඔබ මෙම ඉගෙනුම තුළින් බොහෝ සෙයින් උසස් වෙයි. ඔවුන්ව එතරම් ශ්‍රේෂ්ඨත්වයට පත් කළේ කවුරුන්ද කියා කිසිවෙකු නොදනී. ඔබ දැන් ආරම්භය, මැද සහ අවසානය දන්නවා. ඔබ සෑම කෙනෙකුගේම ජීවිත කතාව දන්නවා. මෙය ඥානයයි. භක්ති මාර්ගයේ ඥානය නොමැත ඔවුන් ඔබට කියා දෙන්නේ භෞතික පූජාවිධි පමණයි. බොහෝ භක්තිය තිබේ. ඔවුන් ඒ පිළිබඳව බොහෝ කතා කරයි. එය ඉතා අලංකාර බව පෙනෙයි. බීජයක ඇත්තේ කුමන අලංකාරයක්ද? එතරම් කුඩා බීජයක් ඉතා විශාල වෙයි. එය භක්තියේ ගසයි භෞතික පූජාවිධි බොහොමයක් තිබේ. ඥානයෙහි තිබෙන්නේ එක් ව්‍යවහාරය පමණයි මන්මනාභව! පරම පියා පවසන්නේ තමෝප්‍රධාන් බවින් සතෝප්‍රධාන් වීම සඳහා, මා සිහිපත් කරන්න. ඔබ කියන්නේ අහෝ පාරිශුද්ධකරුවාණෙනි, පැමිණ අපව පිවිතුරු කරන්න! රාවණ්ගේ රාජධානියේ, සෑම කෙනෙක්ම අපවිත්‍ර මෙන්ම සිටින්නේ දුකින්ය. රාමාගේ රාජධානියේ, සෑම කෙනෙක්ම පිවිතුරු වන අතර සිටින්නේ ප්‍රීතියෙනි. මෙම ව්‍යවහාර තිබේ රාම රාජ්‍යය සහ රාවන රාජ්‍යය. ඔය දරුවන් හැර වෙනත් කිසිවෙක් රාම රාජ්‍යය නොදනී. ඔබ දැන් උත්සාහ දරමින් සිටිනවා. ඔබ හැර වෙනත් කිසිවෙකු උපත් 84 හි රහස නොදනී. අන් අය මෙසේ කියන නමුත් ‘පරමාත්ම දෙවියන් පවසයි නිරන්තරයෙන් මා පමණක් සිහි කරන්න!’ඉන් කුමක් වෙයිද? ඔබ සම්පූර්ණ උපත් 84 ගෙන ඇති ආකාරය ගැන ඔවුන්ට විස්තර කළ නොහැක. චක්‍රය දැන් අවසානයකට පැමිණෙනවා. ගීතාව හඬ නගා කියවන අය පවසන්නේ කුමක්ද කියා ගොස් අසා සිටින්න! ඔබගේ බුද්ධිය තුළට දැන් සියළුම ඥානය ගලා යයි. බාබා ඔබගෙන් විමසන්නේ අප මින් පෙර හමු වී

තිබෙනවාද? ඔබ පිළිතුරු දෙන්නේ ඔව් බාබා, අප පෙර චක්‍රයේ මුණ ගැසුණා. බාබා විමසන අතර ඔබ අරුත්බරව නිවැරදි පිළිතුර ලබා දෙයි. ඔබ නිකම්ම ගිරව් මෙන් කතා නොකරයි. ඉන්පසුව බාබා අසන්නේ අප මුණ ගැසුනේ ඇයි? ඔබ ලබා ගත්තේ මොනවාද? එබැවින් ඔබ පිළිතුරු දෙන්නේ අප ලෝක රාජධානිය ලබා ගත්තා, එමෙන්ම සෑම දෙයක්ම එහි අන්තර්ගතයි. ඔබ සාමාන්‍ය මනුෂ්‍යයන්ගෙන් නාරායන් බවට පරිවර්ථනය වන බව පවසන නමුත්, ලෝකයේ අධිපතියන් වීමේදී, රජ, රැජිණ සහ දේවතා පෙළපත එහි අන්තර්ගතයි. රජ, රැජිණ සහ පුරවැසියන් යන සියල්ලන්ම ලෝක අධිපතියන් වෙයි. ශුභ වචන කතා කිරීම යැයි කියන්නේ මෙයටයි. මම සාමාන්‍ය මනුෂ්‍යයෙකුගෙන් නාරායන් බවට පරිවර්ථනය වෙමි, ඊට අඩු නොවෙමි. පරම පියා පවසන්නේ ඔව් දරුවනි! සම්පූර්ණයෙන් උත්සාහ දරන්න! ඔබගේ දින වාර්තාව දෙස බලා, තමන්ගෙන් විමසන්න මෙම තත්ත්වයේ සිට, මට උසස් තත්ත්වයක් හිමි කරගැනීමට හැකි වෙයිද? මා කී දෙනෙකුට මාර්ගය පෙන්වා දී තිබේද? මා කෙතරම් දුරට අන්ධයින්ට සැරයටි වී තිබේද? ඔබ කිසිම සේවයක් නොකරන්නේ නම්, ඔබ පුරවැසියන්ගෙන් කොටසක් බවට පත් වන බව ඔබ වටහා ගත යුතුයි. ඔබගේ හදවතින් විමසන්න මා දැන් මගේ සිරුර අත්හරින්නේ නම්, මට කුමන තත්ත්වයක් ලැබෙයිද? ගමනාන්තය ඉතා ඉහළයි. එබැවින් ඔබ ප්‍රවේශමින් සිටිය යුතුයි. ඔවුන් සැබවින්ම සිහිපත් කිරීමේ නොසිටන බව, සමහර දරුවන්ට වැටහෙන නිසා, දිනපතා වාර්තාවක් තබාගැනීමෙන් ඇති ඵලය කුමක්ද කියා ඔවුන් සිතයි. එයට කියන්නේ අධෛර්යමත් වීම කියාය. ඔවුන් ඉගෙන ගන්නේද ඒ ආකාරයටයි ඔවුන් අවධානය යොමු කරන්නේ නැත. නිකම්ම අසුන්ගෙන සිට, ඔබ ඉතා දක්ෂ බව සිතාගෙන සිටින්න එපා, එසේ වුවහොත් අවසානයේ ඔබ අසමත් වෙයි. ඔබ තමන්ට යහපතක් සිදුකර ගත යුතුයි. ඔබගේ අරමුණ සහ ඉලක්කය තිබෙන්නේ ඔබ ඉදිරියේය. මා ඉගෙන ගෙන, මෙය බවට පත් විය යුතුයි. මෙයද විශ්මයකි. කලි යුගයෙදී ඔවුන්ගේ රාජධානියක් නැත. ස්වර්ණමය යුගයෙදී ඔවුන්ගේ රාජධානිය පැමිණියේ කොහේ සිටද? සෑම දෙයක්ම රඳා පවතින්නේ මෙම ඉගෙනුම මතයි. දේවතාවන් සහ රකුසන් අතර යුද්ධයක් ඇති වී, දේවතාවන් ජයගෙන, රාජධානිය හිමි කරගත්තා නොවෙයි. දේවතාවන් සහ රකුසන් අතර යුද්ධයක් තිබෙන්නේ කෙසේද? කෞරවයන් සහ පාණ්ඩවයන් අතර යුද්ධයක්ද නොමැත. යුද්ධයක් පිළිබඳ කාරණාවට කිසිම අරුතක් නැත. පළමුවෙන්ම ඔවුන්ට කියන්න, පරම පියා මෙසේ පවසන බව සියළුම ශාරීරික නෑදෑකම් අතහැර, තමන් ජීවාත්ම බව සලකන්න. ඔය ජීවාත්ම අශාරීරිකව පැමිණි අතර, ඔබ දැන් අශාරීරිකව ආපසු නිවසට යා යුතුයි. පාරිශුද්ධ ජීවාත්මයන්ට පමණයි, ආපසු නිවසට යෑමට හැකි වන්නේ. තමෝප්‍රධාන් ජීවාත්මයන්ට ආපසු යා නොහැක. ජීවාත්මයන්ගේ අත්තටු කැඩී ඇත. මායා ඔබව අපවිත්‍ර කර තිබේ. ඔබ තමෝප්‍රධාන් නිසා, ඔබට මෙතරම් ඈත, පූජනීය ස්ථානයකට ගමන් කළ නොහැක. ඔබ මුලදී පරම දනව්වේ වැසියන් බව, ඔය ජීවාත්ම පවසයි. චරිත කොටසක් රඟපෑම සඳහා, ඔබ පංච මහා භූතයන්ගෙන් සෑදි, රූකඩයක් හදාගත්තා. කෙනෙක් මිය ගිය විට, මිනිසුන් කියන්නේ ඔහු දිව්‍යලෝකයට ගිය බවයි. එහි ගියේ කවුද? එහි ගියේ ශරීරයද, ජීවාත්මයද? ශරීරය පුළුස්සා දැමූ අතර, ඉතිරි වූයේ ජීවාත්මය පමණයි. ජීවාත්මයට දිව්‍යලෝකයට යෑමට නොහැක. අන් අය, ඔවුන්ට පවසන දේ, මිනිසුන් නිකම්ම නැවතත් කියයි. භක්ති මාර්ගයේ අය කියා දෙන්නේ, භක්තිය පමණයි. ඔවුන් කිසිම කෙනෙකුගේ කාර්යභාරය නොදනී. ඔවුන් පවසන්නේ උසස්ම වන්නේ ශිවාගේ වන්දනාවයි. උසස්ම කෙනා වන්නේ ශිවාය. එබැවින් ඔහු පමණක් සිහි කරන්න! ඔවුන් මාලාවක්ද දෙයි. ඔබට ‘ශිවා, ශිවා’කියමින් පබුළු බ්‍රමණය කරන්නට කියා ඔවුන් කියයි. ඔවුන් මාලාවක් ගෙන, වටහාගැනීමකින් තොරව, දිගින් දිගටම ‘ශිවා, ශිවා’යැයි කියයි. ගුරුන් බොහෝ විවිධ අන්දමේ ඉගැන්වීම් ලබා දෙයි. මෙහි තිබෙන්නේ එක් කාරණාවක් පමණයි. පරම පියාම පවසන්නේ මා සිහිපත් කිරීමෙන් ඔබගේ පාපයන් දුරු වී යයි. ඔබගේ මුවින් ‘ශිවා, ශිවා’යැයි කිව යුතු නැහැ. දරුවෙක් ඔහුගේ පියාගේ නම ජප කරනවාද? මේ සෑම දෙයක්ම අදෘෂ්‍යමාන කාරණාය. ඔබ කරන්නේ කුමක්ද කියා කිසිවෙකු නොදනී. පෙර චක්‍රයේදී මේවා වටහා ගත් අය, එය නැවතත් වටහා ගනී. අළුත් දරුවන් දිගින් දිගටම පැමිණෙන අතර, අඛණ්ඩව ව්‍යාප්තිය සිදුවනවා. ඔබ තව දුරටත් වර්ධනය වන විට, නාටකය ඔබට පෙන්වන සියළුම ජවනිකා, ඔබ නොබැඳි නිරීක්ෂකයන් සේ නරඹයි. අනාගතයේදී සිදුවීමට යන දේ ගැන, බාබා ඔබට කලින් දර්ශන ලබා දෙන්නේ නැත. එසේ නම් එය කෘත්‍රිම වනු ඇත. මෙම කරුණු ඉතා පැහැදිලිවම වටහා ගත යුතුයි. ඔබට දැන් වැටහීම ලැබී ඇති අතර, භක්ති මාර්ගයේදී ඔබ අනුවණයි. භක්තියද නාටකයේ නියම වී ඇති බව ඔබ දන්නවා. ඔය දරුවන් මෙම පැරණි ලෝකයේ ඉන්නේ නැති බව ඔබට දැන් වැටහෙනවා. ශිෂ්‍යයන්ගේ බුද්ධියේ ඔවුන්ගේ ඉගෙනුම තිබේ. ඔබද ප්‍රධාන කරුණු ඔබගේ බුද්ධියේ ධාරණය කරගත යුතුයි. ඇල්ෆා යන අංක එකේ කාරණය ස්ථිර වූ පසුවයි ඔබ ඉදිරියට යා යුත්තේ. එසේ නැත්නම් ඔවුන් දිගින් දිගටම නිෂ්ඵල ප්‍රශ්න අසනු ඇත. සමහර දරුවන් ලිපි ලියා මෙසේ විමසයි ගීතාවේ දෙවියන් ශිවා බව, අහවල්

කෙනා ලිව්ය, එය සම්පූර්ණයෙන් නිවැරදියි. ඔවුන් මෙසේ කියන නමුත් එය ඔවුන්ගේ බුද්ධියේ සනිටුහන් වන්නේ නැත. පරම පියා පැමිණ ඇති බව ඔවුන්ට වැටහුණේ නම්, පැමිණ එවන් පියෙක් හමු වී, තම උරුමය හිමි කර ගැනීමට අවශ්‍ය බව, ඔවුන් කියනු ඇත. එකදු කෙනෙකුටවත් එම විශ්වාසය නොමැත. එවන් ලිපියක් එකදු කෙනෙක්වත් සැනෙකින් ලියා නැත! මෙම ඥානය ඉතා හොඳ බව ඔවුන් ලියන නමුත්, ඔවුන් බොහෝ කාලයක් දුරස්ව සිටි, එමෙන්ම ඔවුන් භක්ති මාර්ගයේදී සොයමින් සැරි සැරූ සහ ඔවුන්ව ලෝකයේ අධිපතියන් බවට පත් කරවීමට දැන් පැමිණ ඇති, එවන් ආශ්වර්යමත් පියෙක් වෙතට දිව ගෙන පැමිණීමට තරම් එඩිතරකමක් ඔවුන්ට නොමැත. ඔවුන් පසුව මතු වනු ඇති. පරම පියා, උසස්ම උසස් පරමාත්ම දෙවියන් බව හඳුනාගෙන ඇත්නම්, ඔවුන් ඔහුට අයත් විය යුතුයි. ඔවුන්ගේ ඔළුගෙඩි විවෘත වන අන්දමේ එවන් පැහැදිලි කිරීමක් ඔබ ඔවුන්ට ලබා දිය යුතුයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබගේ ව්‍යාපාරික කටයුතු කරගෙන යන අතරම, ජීවාත්මය පිවිතුරු කරගැනීමට සහ සිහිපත් කිරීමේ සිටීමට කාලය සාදාගන්න. කිසිම රකුසු ක්‍රියාවක් සිදු නොකරන්න.
2. තමන්ට සහ අන් අයට යහපත සලසා ගන්න. ඉගෙනගෙන අන් අයටත් උගන්වන්න. තමන් බොහෝ දක්ෂ බව නොසලකන්න. සිහිපත් කිරීමේ බලය රැස් කරගන්න.

**වරදානය:** ඔබ ලොවට භාග්‍යය පිරිනමන්නෙකු වී, නම සහ කීර්තිය අත්හැරීමෙන් සැමගේම සෙනෙහස දිනා ගනිත්වා.

ඔවුන් පවසන්නේ පරමාත්ම පියා නම සහ ස්වරූපය ඉක්මවා සිටින බවයි, නමුත් වඩාත්ම සිහිපත් කරනු ලබන්නේ පරමාත්ම පියාගේ නාමයයි. එලෙසම, ඔබත් තාවකාලික නාමයෙන් හා කීර්තියෙන් ඔබ්බට යා යුතු අතර, ඔබ නිරායාසයෙන්ම සැමදාටම සියලු දෙනාගේම සෙනෙහසට පාත්‍ර වනු ඇත. නාමය සහ කීර්තිය ලැබීමේ යාචකයන් වීම අත්හරින අය ලෝකයට වාසනාව පිරිනමන්නන් බවට පත් වේ. ඔබේ කර්මයේ ඵලය එහි සම්පූර්ණ ස්වරූපයෙන් ඉබේටම ඔබ ඉදිරියට පැමිණෙනු ඇත. එබැවින්, සීමිත ආශාවන් ගැන පවා නොදන්නා අය බවට පත් වන්න. නොඉදුණු පලතුරු අනුභව නොකරන්න, එය අත්හරින්න, එවිට වාසනාව ඔබ පසුපස හඹා එනු ඇත.

**පාඨය:** ඔබ පරමාත්ම දෙවියන්ගේ, පරම පියාගේ දරුවන් වන අතර, එබැවින්, ඔබගේ බුද්ධිය නිරන්තරව සිහසුන මත පිහිටා තිබිය යුතුය.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: අශාරීරික ස්ථිතියේ පුහුණුව වැඩි කරන්න(අශාරීරි සහ විදේහි).**

ඔබට අවශ්‍ය සේවය ගැන සිතීම සහ ඒ සඳහා සැලසුම් සකස් කිරීම ඔබ කරනවා විය හැකිය, නමුත් කුමක් සිදුවේදැයි කල්පනා කරන අතරතුර මෙය නොකරන්න. අශාරීරිකව සහ නොබැඳි නිරීක්ෂකයෙකු ලෙස සිටියදී මෙය කරන්න. යමක් ගැන සිතන්න, ඒ සඳහා සැලැස්මක් සකස් කර සැනින්ම ඔබේ ස්ථිතිය අශාරීරික කරගන්න. දැන් එම මනෝ ස්ථිතිය සඳහා අවශ්‍යතාවයක් තිබේ. ඔබේ අශාරීරික ස්ථිතියේ සිටින විට, වලාකුළු පැමිණ යනවා සේ, ඔබට සියලු අහිතකර තත්ත්වයන් ඉතා පහසුවෙන් ජය ගත හැකිය. අශාරීරික වූ යමෙකු ඕනෑම ක්‍රීඩාවක් නරඹන අතරම නොසැලී සහ නිශ්චලව සිටී.